21024

AL/2019/23/S-I(OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.16 / 1400 - 1600

| | | | |
|---|---|---|---|
| දේශපාලන විද්‍යාව I<br>அரசியல் விஞ்ஞானம் I<br>Political Science I | 23 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, පිළිපදින්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**
* එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100කි.

- අංක 1 සිට 15 තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහක් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ ප්‍රකාශ **හතරක්** පමණි. **නිවැරදි** ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. දේශපාලනය අධ්‍යයනය කිරීමෙන් සිසුන්ට
   - A – සමාජය තුළ පවතින බලය සහ අධිකාරය අවබෝධ කර ගැනීමට හැකියාව ලැබේ.
   - B – යහපත් සහ අයහපත් ආණ්ඩුකරණය වෙන් කොට හඳුනාගැනීමට හැකියාව ලැබේ.
   - C – වගකීම් සහිත පුරවැසියන් විය හැකි වේ.
   - D – තමන් තුළ ආධ්‍යාත්මික ගුණය පෝෂණය කරගත හැකි වේ.
   - E – බල අරගලයේ අන්තර්ගතය විශ්ලේෂණය කිරීමට හැකි වේ.

   (1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

2. දේශපාලනය සැලකිලිමත් වන්නේ,
   - A – පොදු ක්ෂේත්‍රයේ කටයුතු පිළිබඳව ය.
   - B – ගැටුම් සාමකාමීව විසඳීම පිළිබඳව ය.
   - C – රාජ්‍යය සහ එහි ආයතන පිළිබඳව ය.
   - D – රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලිය ගැන ය.
   - E – මනුෂ්‍ය ජීවිතය තුළ ආගම ඉටු කරන භූමිකාව ගැන ය.

   (1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

3. නූතන සමාජයන්හි රාජ්‍යය
   - A – අභ්‍යන්තර සහ බාහිර ස්වාධිපත්‍යය හිමි කරගෙන සිටියි.
   - B – ආණ්ඩුවට සමාන ය.
   - C – තම සාමාජිකයන් විය යුත්තේ කවුරුන්දැයි තීරණය කරයි.
   - D – ජාතික රාජ්‍යය යනුවෙන් ද හැඳින්වේ.
   - E – බලහත්කාරී බලය පිළිබඳ ඒකාධිකාරයට හිමිකම් කියයි.

   (1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

4. නූතන සමාජයන්හි ආණ්ඩුව
   - A – වියුක්ත අදහසකි.
   - B – වරින්වර වෙනස් කළ හැකි ය.
   - C – ඒකීය සහ සංඝීය යන ආකාර දෙකට අනුව සංවිධානය කළ හැකි ය.
   - D – රාජ්‍යයේ නියෝජිතයා ය.
   - E – රාජ්‍යත්වයේ අත්‍යවශ්‍ය අංගයකි.

   (1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

5. සම්භාව්‍ය න්‍යායට අනුව ස්වාධිපත්‍යය
   A – රාජ්‍යයේ උත්තරීතර බලය සංකේතවත් කරයි.
   B – අන්සතු කළ නොහැකි ය.
   C – අවශ්‍ය ඕනෑම විටෙක බෙදිය හැකි ය.
   D – නීතියේ උල්පතයි.
   E – හිමි වන්නේ පාලකයාට පමණි.
   (1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

6. ධනවාදී මතවාදයට අනුව
   A – රාජ්‍යය ආර්ථිකය පාලනය කළ යුතු ය.
   B – වෙළෙඳපොළ ගනුදෙනු අදෘශ්‍යමාන හස්තයකින් කළමනාකරණය කෙරේ.
   C – ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ සමාජයේ සෑම ස්ථරයක් වෙතට ම කාන්දු වෙයි.
   D – නිෂ්පාදනයේ අරමුණ විය යුත්තේ පාරිභෝගික අවශ්‍යතා තෘප්තිමත් කිරීමයි.
   E – නිදහස් වෙළෙඳපොළ ආර්ථිකය පුද්ගල නිදහස වර්ධනය කරයි.
   (1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

7. ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ලක්ෂණවලට අයත් වන්නේ,
   A – විධායකය සහ ව්‍යවස්ථාදායකය සඳහා වෙන් වෙන් මැතිවරණ පැවැත්වීම ය.
   B – ව්‍යවස්ථාදායකයෙන් ස්වාධීනව විධායකය පැවැතීම ය.
   C – ආණ්ඩුව සංවිධානය කිරීමේ දී බලතල වෙන් කිරීමේ සිද්ධාන්තය යොදාගැනීම ය.
   D – පක්ෂ දේශපාලන හේතු මත ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් කළ නොහැකිය යන මූලධර්මය ය.
   E – ව්‍යවස්ථාදායකයේ සහ විධායකයේ ධුර කාල සමගාමීව අවසන් වීම ය.
   (1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

8. විද්‍යාත්මක සමාජවාදය
   A – කම්කරු පන්තිය ධනවාදී රාජ්‍යයට අවනත විය යුතු බව කියා සිටියි.
   B – රාජ්‍යය යනු අධිපති පන්තියේ බල උපකරණයක් යැයි විශ්වාස කරයි.
   C – රාජ්‍යය පවතින්නේ පන්ති සහිත සමාජවල යැයි කියා සිටියි.
   D – කොමියුනිස්ට් සමාජය තුළ දී රාජ්‍යය වියැකී යනු ඇතැයි විශ්වාස කරයි.
   E – කාල් මාක්ස් හා ෆ්‍රෙඩ්රික් එංගල්ස්ගේ ඉගැන්වීම් මත පදනම් ව ඇත.
   (1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

9. ඒකාධිපති ආණ්ඩුක්‍රමයක ලක්ෂණ වන්නේ,
   A – ලිබරල් සමාජ සහ දේශපාලන දර්ශනයක් නොතිබීමයි.
   B – මහජන දුක්ගැනවිලිවලට සවන්දීමට උනන්දුවක් නොතිබීමයි.
   C – අත්තනෝමතික පාලනයයි.
   D – මහජනතාවට වගකීමට පාලකයා සතු කැමැත්තයි.
   E – මහජන ජීවිතයේදී ජනමාධ්‍යයට හිමි යටහත් භූමිකාවයි.
   (1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

10. සංධීය ආණ්ඩුක්‍රම ආකෘතිය යටතේ
   A – ආණ්ඩු බලය මධ්‍යම සහ ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදී පවතියි.
   B – මධ්‍යම සහ ප්‍රාන්ත ආණ්ඩු අතර ඇති ආරවුල් ශ්‍රේෂ්ඨාධිකරණය බේරුම් කරයි.
   C – ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා මධ්‍යම සහ ප්‍රාන්ත ආණ්ඩු අතර සහයෝගීතාව අනිවාර්ය වේ.
   D – ප්‍රාන්ත රාජ්‍ය තමන් සතු නිශ්චිත අනන්‍යතා තබා ගනිමින් එකමුතුව සිටියි.
   E – මධ්‍යම ව්‍යවස්ථාදායකයට ප්‍රාන්ත ව්‍යවස්ථාදායක අභිබවා යා හැකි ය.
   (1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

11. ශුද්ධ කැබිනට් ආණ්ඩුක්‍රමයක ලක්ෂණ වන්නේ,
   A – නාමික සහ සත්‍ය විධායකයක් පැවැතීමයි.
   B – අමාත්‍යවරුන්ගේ සාමූහික වගකීමයි.
   C – ව්‍යවස්ථාදායකය නොවැදගත් තත්ත්වයට පහත හෙළීමයි.
   D – විධායකය සහ ව්‍යවස්ථාදායකය අතර ඇති අන්‍යෝන්‍ය සහයෝගීතා සම්බන්ධතාවයි.
   E – ව්‍යවස්ථාදායකය එහි නිල කාලය සම්පූර්ණ වීමට පෙර විසුරුවා හැරීමේ හැකියාවයි.
   (1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**12.** ලිබරල් ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුක්‍රමයක ලක්ෂණවලට ඇතුළත් වන්නේ,
A – ව්‍යවස්ථානුකූල ආණ්ඩුවයි.
B – ආණ්ඩුවේ ආයතන අතර බලතල වෙන් කිරීමයි.
C – තරගකාරී දේශපාලන පක්ෂ ක්‍රමයයි.
D – ජනමාධ්‍ය ක්ෂේත්‍රය මත පවතින ආණ්ඩුවේ පාලනයයි.
E – ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මූලික අයිතිවාසිකම් සහතික කර තිබීමයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**13.** නීතියේ ආධිපත්‍යය යන සංකල්පය කියා සිටින පරිදි
A – සෑම කෙනෙකු ම නීතිය ඉදිරියේ සමාන ය.
B – පාලකයා මෙන් ම පාලිතයා ද රාජ්‍යයේ නීතිවලට අවනත විය යුතු ය.
C – පාලකයා නීතියට බැඳීමෙන් නිදහස් ය.
D – අතීතයට බලපාන නීති පැනවීම නුසුදුසු ය.
E – චූදිතයකු වරදකරුවෙකු බවට ඔප්පු වන තුරු නිර්දෝෂී යැයි සැලකිය යුතු ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**14.** මානව අයිතිවාසිකම්
A – සෑම මනුෂ්‍යයකුට ම තමන් මනුෂ්‍යයකු වීම නිසා හිමි වන අයිතිවාසිකම් ය.
B – විශ්වීය ය.
C – අර්ථවත් වන්නට නම් ඒවා නීතියෙන් සහතික කළ යුතු වේ.
D – ජාත්‍යන්තර නීතියේ කොටසකි.
E – රාජ්‍යයක ව්‍යවස්ථාවෙන් පිළිගනු ලැබ ඇති අයිතිවාසිකම් පමණකි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**15.** බලතල වෙන් කිරීමේ සංකල්පය උපකල්පනය කරන පරිදි
A – පුරවැසි නිදහස සහතික කිරීම සඳහා රාජ්‍ය බලය කේන්ද්‍රගත වීම වැළැක්වීම අවශ්‍ය වේ.
B – වෙන් කරනු ලැබූ බලය භාවිත කරනු ලැබිය යුත්තේ ආණ්ඩුවේ වෙන් වෙන් ශාඛාවන් මගිනි.
C – අත්තනෝමතික ආණ්ඩුකරණය වැළැක්වීමට සංවරණ හා තුලන යාන්ත්‍රණ අවශ්‍ය වේ.
D – පරම බලය දූෂණයට තුඩු නොදෙයි.
E – බලය බලයෙන් ම සංවරණය කළ හැකි ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

● අංක **16** සිට **25** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධව ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් **නිවැරදි** වන්නේ ප්‍රකාශ හතරක් පමණි. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

**16.** නූතන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවල පවත්නා ව්‍යවස්ථාදායකය
(1) නීතිය හා සාමය පවත්වා ගැනීමට නීති පනවයි.
(2) ආණ්ඩුව පවත්වා ගැනීමට අවශ්‍ය මහජන මුදල් වෙන් කරයි.
(3) ඒක මාණ්ඩලික හෝ ද්වි මාණ්ඩලික හෝ විය හැකි ය.
(4) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නංවයි.
(5) ජනතා නියෝජිතයන්ගෙන් සමන්විත වේ.

**17.** අධිකරණය පිළිබඳ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සම්ප්‍රදායට අනුව
(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කළ යුතු ය.
(2) විනිශ්චයකාරවරුන්ගේ ධුර කාලය සුරක්ෂිත කළ යුතු ය.
(3) විනිශ්චයකාරවරුන්ගේ වැටුප් ඔවුන්ගේ ධුර කාලය තුළදී අඩු කළ නොහැකි ය.
(4) විනිශ්චයකාරවරුන් දේශපාලනිකව මධ්‍යස්ථ විය යුතු ය.
(5) විනිශ්චයකාරවරුන් නඩු විසඳීමේදී විධායකයේ අදහස් විමසිය යුතු ය.

**18.** රාජ්‍යය පනවන නීති
(1) ස්වාධිපත්‍යයේ ප්‍රකාශනයි.
(2) සමාජයේ ඇති චාරිත්‍ර වාරිත්‍රවලට සමාන ය.
(3) සමාජයේ සියලු ම සාමාජිකයන් බැඳ තැබෙන ඒවා ය.
(4) පුරවැසියන්ගේ චර්යාව පාලනය කිරීම අරමුණු කර ගනියි.
(5) ආධ්‍යාත්මික ජීවිතයට මග පෙන්වන්නේ නැත.



Department of Examinations Sri Lanka

19. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලවාදයට අනුව
(1) කිසිම පුද්ගලයකුට නීතිය අභිබවා යා නොහැකියි.
(2) ආණ්ඩුව කටයුතු කළ යුත්තේ නීතියට අනුකූලව ය.
(3) පවත්නා දේශපාලන තත්ත්වයන් මත ආණ්ඩුවට පුරවැසි නිදහස නොසලකා හැරිය හැකි ය.
(4) පාලකයාගේ හා පාලිතයාගේ යුතුකම් හා වගකීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් දැක්විය යුතු ය.
(5) පාලකයන්ගේ සහ ආණ්ඩුවේ ආයතනවල චර්යාව පුරෝකථනය කළ හැකි විය යුතු ය.

20. සිවිල් සමාජය
(1) පිහිටා ඇත්තේ රාජ්‍යයේ පරිමණ්ඩලයෙන් පිටත ය.
(2) පුරවැසියන්ගේ ස්වේච්ඡා සංවිධානවලින් සමන්විත වේ.
(3) සෞඛ්‍ය සම්පන්න ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා තිබිය යුතු අත්‍යවශ්‍ය අංගයකි.
(4) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලියට යෙදවුම් සපයයි.
(5) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයට බාධාවකි.

21. නූතන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවල පවතින නියෝජනය
(1) අත්තනෝමතික පාලනයට මගපාදයි.
(2) පුරවැසියන් සහ ආණ්ඩුව සම්බන්ධ කරවන මාධ්‍යයයි.
(3) සිදු වන්නේ චක්‍ර ක්‍රම මගිනි.
(4) ක්‍රියාත්මක වන්නේ මැතිවරණ මාර්ගයෙනි.
(5) භාරකාරත්වය, අභිනියෝජනය සහ ජනවරම යන ස්වරූප ගත හැකි ය.

22. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
(1) නම්‍ය සහ අනම්‍ය, ඒකීය සහ සංඝීය, ජනාධිපති සහ පාර්ලිමේන්තු යනුවෙන් වර්ගීකරණය කෙරේ.
(2) ආණ්ඩුව සහ මහජනතාව අතර සම්බන්ධතාවේ ස්වභාවය සහ අන්තර්ගතය නිර්ණය කරයි.
(3) ආණ්ඩුවේ ආයතනවල බලතල, කාර්යයන් සහ ක්‍රියාපටිපාටිය නිශ්චය කරයි.
(4) ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වයේ සීමාවන් නියම කරයි.
(5) ප්‍රතිෂ්ඨාපිත නීතිවලින් ඔබ්බට ගොස් ක්‍රියා කිරීමට ආණ්ඩුවලට ඉඩ සලසා දෙයි.

23. අභිලාෂ (ආශා) කණ්ඩායම්
(1) ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණයට ආධාර වේ.
(2) දේශපාලන පක්ෂවලින් වෙන් කොට හඳුනාගත හැකි ය.
(3) සර්වබලධාරී ක්‍රම තුළ පැවැතීමට ඉඩ ලබයි.
(4) ප්‍රතිපත්ති සම්පාදකයන්ට බලපෑම් කිරීමෙන් තම අරමුණු ඉටු කරගැනීමට අපේක්ෂා කරයි.
(5) තම කණ්ඩායම් සාමාජිකයින්ගේ සුබසාධනය ගැන සැලකිලිමත් වෙයි.

24. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවල දේශපාලන පක්ෂ
(1) වැදගත් දේශපාලන කරුණු පිළිබඳව මහජනතාවට අධ්‍යාපනය ලබාදෙයි.
(2) දේශපාලන බලය ලබාගැනීම අරමුණු කරගනියි.
(3) දේශපාලන ක්‍රමයට අවශ්‍ය අනාගත නායකයින් බඳවා ගනියි.
(4) ආණ්ඩු පිහිටුවීමේ මාධ්‍යයයි.
(5) ඒකාධිපති පාලනයට මගපාදයි.

25. රාජ්‍ය ප්‍රතිපත්ති
(1) පුද්ගලික ව්‍යාපාරික කණ්ඩායම්වලට වාසි සැලසීම අපේක්ෂා කරයි.
(2) මහජන දුක්ගැනවිලි විසඳීම අරමුණු කරගනියි.
(3) නිශ්චිත අරමුණු සහිත ක්‍රියාදාමයකි.
(4) ක්‍රියාත්මක කෙරෙන්නේ නිලබල ක්‍රමය මගිනි.
(5) සම්පාදනය කරනු ලබන්නේ දේශපාලන ක්‍රමයක සිටින මහජන පිළිගැනීම ඇති අධිකාරීන් විසිනි.

[පස්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

- අංක **26** සිට **35** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ව ප්‍රකාශ පහ බැගින් දක්වා ඇත. එම ප්‍රකාශ අතුරෙන් මාතෘකාවට අදාළ වන්නේ ප්‍රකාශ **හතරක්** පමණි. **අදාළ** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

**26.** 1833 කෝල්බෲක් කැමරන් කොමිසමේ නිර්දේශ වූයේ
A – රාජකාරි ක්‍රමය අහෝසි කිරීම ය.
B – විධායක සහ ව්‍යවස්ථාදායක මණ්ඩල පිහිටුවීම ය.
C – පොදු අපරාධ විනිශ්චය ක්‍රමයක් හඳුන්වාදීම ය.
D – සියලු වෙළෙඳ ඒකාධිකාර අවසන් කිරීම ය.
E – අධිකරණය සම්බන්ධව ආණ්ඩුකාරයාගේ බලය ශක්තිමත් කිරීම ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**27.** ලංකා ජාතික සංගමය
A – ඉදිරිපත් කළේ මධ්‍යස්ථවාදී දේශපාලන ඉල්ලීම් ය.
B – ස්වදේශීය ජනතාවට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත්වැසියන් ලෙස සමාන පිළිගැනීමක් ඉල්ලා සිටියේ ය.
C – කුල, ආගමික සහ වාර්ගික අනන්‍යතා අනුව බෙදී තිබිණ.
D – සාමාන්‍ය මහජනතාව දේශපාලන නිදහස උදෙසා සංවිධානය කළේ ය.
E – බ්‍රිතාන්‍ය පාලනය වහාම ඉවත් කරගත යුතු යැයි ඉල්ලා සිටීමෙන් වැළකී සිටියේ ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**28.** ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ
A – සර්වජන ඡන්දබලය හඳුන්වා දුන්නේ ය.
B – විධායක කාරක සභා ක්‍රමය පිහිටුවී ය.
C – ස්වදේශීය දේශපාලන නායකයින්ට ආණ්ඩුවේ කටයුතුවලට සහභාගි වීමේ හැකියාව ලබා දුන්නේ ය.
D – රාජ්‍ය නිලධාරීන් තිදෙනා අධිරාජ්‍ය අභිලාෂ ආරක්ෂා කළ යුතු යැයි අපේක්ෂා කළේ ය.
E – ආණ්ඩුකාරයා ආණ්ඩුවේ නාමික ප්‍රධානියාගේ තත්ත්වයට පත් කළේ ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**29.** සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පැවැති පාර්ලිමේන්තුව
A – ඕනෑම නීතියක් පැනවීමේ හෝ අවලංගු කිරීමේ හෝ බලය භුක්ති වින්දේ ය.
B – සමන්විත වූයේ කිරීටය නියෝජනය කළ අග්‍රාණ්ඩුකාරයා, සෙනෙට් සභාව සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය යන ඒවායින් ය.
C – තෝරාපත් කරගනු ලැබූ සහ නම් කරනු ලැබූ සාමාජිකයන්ගෙන් සමන්විත විය.
D – තම ව්‍යවස්ථාදායක බලය පිළිබඳ සීමාවන්ට මුහුණ පෑවේ ය.
E – ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් විය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**30.** ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා
A – රාජ්‍යයේ නාමික ප්‍රධානියා විය.
B – නම් කරනු ලැබුවේ අග්‍රාමාත්‍යවරයා/වරිය විසිනි.
C – ජාතික රාජ්‍ය සභාවේ සම්මත කරනු ලැබූ යෝජනාවක් මගින් ඉවත් කළ හැකි විය.
D – නිලකාලය තුළදී නෛතික මුක්තියට හිමිකම් කීවේ ය.
E – ජාතික රාජ්‍ය සභාව කැඳවීමේ සහ විසුරුවා හැරීමේ අභිමතානුසාරී බලය හිමිව සිටියේ ය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**31.** 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ජාතික රාජ්‍ය සභාව
A – විධායක, ව්‍යවස්ථාදායක සහ අධිකරණ බලයට හිමිකම් කී ය.
B – රාජ්‍යයේ උත්තරීතර ආයතනය විය.
C – රාජ්‍ය සේවය පාලනය කිරීමේ බලය සහිත විය.
D – ඒක මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් විය.
E – ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයට වග උත්තර කිව යුතු විය.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

[හයවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**32.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව අංග වූයේ
A – ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය ය.
B – සමානුපාතික නියෝජන ක්‍රමය ය.
C – මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධව නීතිමය පිළියම් ය.
D – ඔම්බුඩ්ස්මන්වරයා ය.
E – ජනාධිපති කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා වීම ය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**33.** ඇමෙරිකා එක්සත් ජනපදයේ සංධීය ක්‍රමය
A – ප්‍රාන්ත රාජ්‍ය පනහකින් සහ මධ්‍යම ආණ්ඩුවෙන් සමන්විත වේ.
B – හවුලේ බෙදාගත් ස්වාධිපත්‍යය ලක්ෂණ කොට ගෙන ඇත.
C – ශේෂ බලතල ප්‍රාන්ත ආණ්ඩුවලට පවරා ඇත.
D – සංධීය ආණ්ඩුවේ සාමාජිකත්වයෙන් ඉවත් වීමට ප්‍රාන්ත රාජ්‍යවලට අවකාශ සපයා ඇත.
E – පෙර පැවැති සහසංධීය ක්‍රමය වෙනුවට පිහිටුවනු ලැබිණ.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**34.** බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම සම්ප්‍රදායට අනුව
A – රැජිනට හිමිව ඇත්තේ ආණ්ඩුව සම්බන්ධව නාමික බලතල පමණි.
B – පාර්ලිමේන්තුවට අනාගත පාර්ලිමේන්තුවක් බැඳ තබන තීරණ ගත නොහැකි ය.
C – දෙවන මණ්ඩලය පාර්ලිමේන්තුවේ අංගයක් නොවේ.
D – අග්‍රාමාත්‍යවරයා සමානයන් අතර ප්‍රථමයා ය.
E – පාර්ලිමේන්තුවට ඕනෑම නීතියක් පැනවීමට හෝ අවලංගු කිරීමට හෝ හැකි ය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**35.** ගෝලීයකරණය
A – නූතන රාජ්‍යයේ ස්වාධිපත්‍යය අභියෝගයට ලක් කර ඇත.
B – මෙහෙයවනු ලබන්නේ නව ලිබරල් ආර්ථික ප්‍රතිසංස්කරණ මගිනි.
C – නූතන රාජ්‍යය සංධීය රාජ්‍යයක් විය යුතු යැයි යෝජනා කරයි.
D – පාරජාතික ජාලයන්ගෙන් සමන්විත වන නව ක්‍රමයකි.
E – ගෝලීය ප්‍රාග්ධන ගලා යාම තුළින් ජාතික රාජ්‍යවල බලය සීමා කරයි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

● අංක **36** සිට **40** තෙක් ඇති ප්‍රශ්න සඳහා එක් එක් ප්‍රශ්නයේ මාතෘකාවට අදාළ ප්‍රකාශ පහ බැගින් දී ඇත. ඒවායේ **සාවද්‍ය** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

**36.** වර්තමාන ජාත්‍යන්තර ක්‍රමය තුළ
A – එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක ආණ්ඩුව ලෙස ක්‍රියා කරයි.
B – ඇමෙරිකා එක්සත් ජනපදය ලෝක නායකයා ලෙස සෑම රටක් විසින්ම පිළිගනු ලැබ ඇත.
C – ඉන්දියාව සහ ජර්මනිය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ ස්ථාවර සාමාජිකයින් ය.
D – එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝකයේ සාමූහික ආරක්ෂාව සඳහා වග කියයි.
E – සාක් සංවිධානයේ සාමාජික රටවල් සහසංධීය රාජ්‍ය මණ්ඩලයක් පිහිටුවා ගෙන ඇත.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**37.** සමකාලීන ජාත්‍යන්තර ක්‍රමයේ ලක්ෂණ වී ඇත්තේ
A – එක්සත් ජාතීන්ගේ සංවිධානයට තම ස්වාධිපත්‍යය යටත්කොට ඇති ජාතික රාජ්‍ය ක්‍රමයක් පැවැතීමයි.
B – විශාල හා කුඩා රාජ්‍ය අතර යුද්ධයෙන් තොර සාමකාමී සහජීවනයක් පැවැතීමයි.
C – චීනය නව ගෝලීය සුපිරි බලවතා ලෙසට සෑම රාජ්‍යයක් විසින් ම පිළිගනු ලැබීමයි.
D – බහු ධ්‍රැවීය ලෝක ක්‍රමයක් පැවතීමයි.
E – ද්වි ධ්‍රැවීය ලෝක ක්‍රමයක් පැවතීමයි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE



Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**38.** ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රම මාදිලිය
A – අර්ධ සංධීය ක්‍රමයකි.
B – වෙස්ට්මින්ස්ටර් ආණ්ඩුක්‍රමයට සජීවී නිදසුනකි.
C – සාමූහික විධායක ක්‍රමය ප්‍රතික්ෂේප කොට ඇත.
D – කැන්ටන් පනවන නීතිවල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලත්වය තීරණය කිරීමේ බලය ෆෙඩරල් අධිකරණයට පවරා ඇත.
E – කැන්ටන්වල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පැනවීමේ බලය මධ්‍යම ආණ්ඩුවට පවරා දෙයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**39.** ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය
A – රට, සංධීය රාජ්‍යයක් බවට පරිවර්තනය කොට ඇත.
B – හඳුන්වා දෙන ලද්දේ රටෙහි ජනවාර්ගික ගැටලුව විසඳීම සඳහා ය.
C – සෙනෙට් මණ්ඩලයක් බිහි කර ඇත.
D – ආණ්ඩුකාරයා ප්‍රධානත්වය දරන අමාත්‍ය මණ්ඩලයක් නිර්මාණය කර ඇත.
E – පළාත් සභාවලට පූර්ණ ව්‍යවස්ථාදායක බලය ලබා දී ඇත.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

**40.** නූතන ප්‍රජාතන්ත්‍රවාදී රටවල මිශ්‍ර විධායක ක්‍රමය
A – ජනාධිපති සහ කැබිනට් ආණ්ඩුක්‍රම මිශ්‍ර කිරීමට ඉඩ නොතබයි.
B – අවශ්‍ය වූ විට ජනාධිපතිවරයා ඉක්මවා යාමට අග්‍රාමාත්‍යවරයාට ඉඩ සපයයි.
C – ජනාධිපතිවරයකු, අග්‍රාමාත්‍යවරයකු සහ කැබිනට් මණ්ඩලයක් සඳහා විධිවිධාන සපයයි.
D – අමාත්‍යවරුන් තම අභිමතය පරිදි තෝරාගැනීමට ජනාධිපතිවරයා/වරියට හැකියාව ලබා දෙයි.
E – ව්‍යවස්ථාදායකයේ විශ්වාසය නොමැතිව පැවැතීමට අමාත්‍ය මණ්ඩලයට අවකාශ ලබා දෙයි.
(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE

● අංක **41** සිට **45** තෙක් ඇති ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධව ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් **එක්** ප්‍රකාශයක් සාවද්‍ය වේ. **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

**41.** අර්ධ සංධීය ආණ්ඩුක්‍රමය
(1) ඒකීය සහ සංධීය ලක්ෂණ සහිත ය.
(2) ප්‍රංශයේ සහ ශ්‍රී ලංකාවේ පවතියි.
(3) ඉන්දියාවේ සාර්ථකව ක්‍රියාත්මක වී තිබේ.
(4) මධ්‍යම සහ ප්‍රාන්ත මට්ටමේ පුරවැසිභාවයන් දෙකකට ඉඩ සලසන්නේ නැත.
(5) හදිසි අවස්ථා තත්ත්වයන් යටතේ ඒකීය ආණ්ඩුවක් ලෙස ක්‍රියා කරයි.

**42.** යුරෝපා සංගමය
(1) මහා බ්‍රිතාන්‍යයේ සාමාජිකත්වය පිළිබඳව ගැටලුවකට මුහුණ දී සිටියි.
(2) යුරෝපීය රාජ්‍යයන් අතර සහයෝගීතාව ගොඩ නැඟීමට ක්‍රියාකරමින් සිටී.
(3) බ්‍රසල්ස් නුවර මූලස්ථානය කොට ගෙන ඇත.
(4) පොදු පාර්ලිමේන්තුවක් ඇති අන්තර් රාජ්‍ය සංවිධානයකි.
(5) මානව දයාවාදී සංවිධානයකි.

**43.** යටත්විජිත යුගයේ ශ්‍රී ලංකාවේ පැවැති වාර්ගික නියෝජන ක්‍රමය
(1) රටට හඳුන්වා දෙන ලද පළමුවන නියෝජන ක්‍රමයයි.
(2) සුළු වාර්ගික කණ්ඩායම්වල සහය ලැබීය.
(3) බ්‍රිතාන්‍යයන්ගේ බෙදා පාලනය කිරීමේ ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක් විය.
(4) හොඳම ප්‍රජාතන්ත්‍රවාදී නියෝජන ක්‍රමයක් ලෙස සැලකේ.
(5) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් අහෝසි කරනු ලැබිණි.

**44.** ශ්‍රී ලංකාවේ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව
(1) 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ස්ථාපිත කෙරිණි.
(2) සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත ය.
(3) පාර්ලිමේන්තුවේ කථානායකවරයා එහි සභාපතිවරයා ලෙස සලකයි.
(4) රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය සහතික කිරීම අරමුණු කරයි.
(5) උසස් රාජ්‍ය නිලධාරීන් සිය අභිමතය පරිදි පත් කිරීමට ජනාධිපතිවරයාට බලය පවරයි.



Department of Examinations Sri Lanka

**45.** ශ්‍රී ලංකාවේ පළාත් පාලන ක්‍රමය
(1) ආණ්ඩු ව්‍යුහයේ තෙවැනි තලයයි.
(2) නියාමන සහ පරිපාලන බලතල භුක්ති විඳියි.
(3) මිශ්‍ර මැතිවරණ ක්‍රමයකින් සාමාජිකයින් තෝරාපත් කිරීමට අවකාශ සපයයි.
(4) මධ්‍යම ආණ්ඩුවේ සෘජු අධීක්ෂණය යටතේ පවතියි.
(5) ප්‍රාදේශීය මට්ටමේ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කරතැයි අපේක්ෂා කෙරේ.

- අංක **46** සිට **50** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙකක් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4), සහ (5) යන වරණවලින් කවර වරණයදැ'යි තෝරා උත්තර පත්‍රයෙහි උචිත ලෙස ලකුණු කරන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **46.** | ශ්‍රී ලංකාවේ, දෙවන ජනරජ ව්‍යවස්ථාවට සිදු කළ දහනව වන සංශෝධනය යටතේ ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා පත් කරනු ලැබේ. | පාර්ලිමේන්තුවේ උපරිම විශ්වාසය ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය. |
| **47.** | 1978 ව්‍යවස්ථාවේ දහඅට වන සංශෝධනය ස්වාධීන කොමිෂන් සභා දුර්වල කළේ ය. | දහ අටවන ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ ධූර වාර ගණන පිළිබඳ සීමා ඉවත් කෙරිණි. |
| **48.** | 1978 ව්‍යවස්ථාවේ දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා ක්‍රමය හඳුන්වා දෙනු ලැබිණි. | පළාත් සභා ක්‍රමය ඉන්දියානු සංධීය ක්‍රමයට සෑම අතින්ම සමාන ය. |
| **49.** | දෙවන ජනරජ ව්‍යවස්ථාව ද්වි-මාණ්ඩලික ව්‍යවස්ථාදායක් සඳහා විධිවිධාන සැලසී ය. | දෙවන ජනරජ ව්‍යවස්ථාවෙහි මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය, කණ්ඩායම් අයිතිවාසිකම් පිළිගෙන තිබේ. |
| **50.** | 1978 මුල් ව්‍යවස්ථාව, පාර්ලිමේන්තු මැතිවරණ සඳහා මනාප ක්‍රමය සමග සමානුපාතික නියෝජනය හඳුන්වා දුන්නේ ය. | සමානුපාතික නියෝජන ක්‍රමය, පක්ෂ නායකත්වයේ බලය වර්ධනය කළේ ය. |

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

21024

AL/2019/23/S-II(OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம் II
Political Science II

23 S II

2019.08.19 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ..................................

| A කොටස | |
|---|---|
| මුළු ලකුණු | 20 |

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **A, B** හා **C** වශයෙන් කොටස් **තුනකින්** යුක්ත ය.
* **A** කොටස තුළ කෙටි ප්‍රශ්න **20** ක් අන්තර්ගත වේ. සම්පූර්ණ පිළිතුරක් සඳහා ලකුණු **01** ක් ද, අර්ධ පිළිතුරක් සඳහා ලකුණු **1/2** ක් ද හිමි වේ. මෙම කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයා එය **B** හා **C** කොටස්වල පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
* **B** හා **C** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## A කොටස

**1.** ප්‍රජාතන්ත්‍රවාදය සම්භාව්‍ය ග්‍රීක යුගයේ සිට නූතන යුගය දක්වා සිදු වූ විකාශනයේදී ස්වරූප දෙකකින් පැවත තිබේ. එම ස්වරූප **දෙක** මොනවා ද?

(1) ..............................................................

(2) ..............................................................

**2.** සම්භාව්‍ය ග්‍රීසියේ සිටි දේශපාලන චින්තකයින් දෙදෙනෙකු දේශපාලන අධ්‍යයනයේ පුරෝගාමීන් ලෙස සැලකෙති. ඒ **දෙදෙනා** නම් කරන්න.

(1) ..............................................................

(2) ..............................................................

**3.** දේශපාලන චින්තනයේ සංවර්ධනයට දායක වූ ඉපැරණි ඉන්දීය සහ චීන දේශපාලන චින්තකයකු බැගින් නම් කරන්න.

(1) ඉන්දියාව : ..............................................................

(2) චීනය : ..............................................................

**4.** බ්‍රිතාන්‍ය සමාජ සම්මුතිවාදී චින්තකයින් දෙදෙනෙකු විසින් 'ප්‍රකෘති තත්ත්වය' දෙයාකාරයකට විස්තර කරනු ලැබ ඇත. ඒ **දෙදෙනා** නම් කරන්න.

(1) ..............................................................

(2) ..............................................................

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**5.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කිරීමේ ක්‍රියාපටිපාටියේ ඇති දුෂ්කරතා මට්ටම පදනම්ව ඒවා වර්ග දෙකකට බෙදනු ලැබේ. එම වර්ග **දෙක** නම් කරන්න.

(1) ..............................................................................

(2) ..............................................................................

**6.** පහත සඳහන් දේශපාලන ආයතන දෙක පිහිටු වූ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා **දෙක** මොනවා ද?

(1) ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකය ..............................................

(2) ඔම්බුඩ්ස්මන්වරයා ..............................................

**7.** පහත සඳහන් මූලධර්ම අවධාරණය කරන්නා වූ දේශපාලන ක්‍රම **දෙක** නම් කරන්න.

(1) නිදහස, ජීවිතය සහ පුද්ගලික දේපළ පිළිබඳ අයිතිය

..............................................................................

(2) දේපළ පිළිබඳ සාමූහික අයිතිය

..............................................................................

**8.** පහත සඳහන් ප්‍රකාශ රාජ්‍යය පිළිබඳ න්‍යාය දෙකකට සම්බන්ධ ය. ඒවා මොනවා ද?

(1) රාජ්‍යය ක්‍රමික ක්‍රියාවලියක් තුළින් පැන නැගිණ.

..............................................................................

(2) රාජ්‍යය පෞද්ගලික දේපළවල සම්භවය සමග පැන නැගිණ.

..............................................................................

**9.** පහත සඳහන් සංකල්ප හඳුන්වා දුන් දේශපාලන චින්තකයින් **දෙදෙනා** නම් කරන්න.

(1) දාර්ශනික පාලකයා ..............................................

(2) පොදු කැමැත්ත ..............................................

**10.** ක්‍රි.ව. 2000 න් පසුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හඳුන්වා දෙන ලද සංශෝධන දෙකක් මගින් ජනාධිපතිවරයා සතු බලතල පහත සඳහන් දෙයාකාරයෙන් වෙනස් කරනු ලැබීය. එම සංශෝධන මොනවා ද?

(1) ජනාධිපතිවරයාගේ බලය ශක්තිමත් කළ සංශෝධනය ..............................................

(2) ජනාධිපතිවරයාගේ බලය අඩු කළ සංශෝධනය ..............................................

**11.** පහත සඳහන් ප්‍රකාශ දෙකෙහි සඳහන් වන්නේ දේශපාලන ආයතන දෙකක් පිළිබඳව ය. ඒවා නම් කරන්න.

(1) මැතිවරණ තුළින් දේශපාලන බලය ලබාගැනීම අරමුණු කරගත් සංවිධාන

..............................................................................

(2) මහජන උද්ඝෝෂණවලින් ස්වකීය අරමුණු ලබාගැනීමට උත්සාහ කරන සංවිධාන

..............................................................................

**12.** (1) ඇමෙරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකයේ නිල නාමය කුමක් ද?

..............................................................................

(2) ඉන්දියාවේ මධ්‍යම ආණ්ඩුවේ පාර්ලිමේන්තුවේ ඉහළ මන්ත්‍රී මණ්ඩලයේ නිල නාමය කුමක් ද?

..............................................................................



Department of Examinations Sri Lanka

**13.** (1) යටත්විජිත ශ්‍රී ලංකාවේ සීමිත ඡන්ද බලය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක් ද?

..........................................................................................

(2) යටත්විජිත ශ්‍රී ලංකාවේ විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක් ද?

..........................................................................................

**14.** ෆැසිස්ට් මතවාදය වෙනුවෙන් පෙනී සිටි යුරෝපා රාජ්‍ය නායකයින් **දෙදෙනෙකු** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

**15.** පළාත් සභා ස්ථාපිත කිරීමේදී 1978 ව්‍යවස්ථාවට සිදු කළ 13 වන සංශෝධනය මගින් විෂය ලැයිස්තු තුනක් හඳුන්වා දී තිබේ. ඉන් ඕනෑම **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

**16.** ඒකීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

**17.** දේශපාලනය අධ්‍යයනය කිරීමේ නූතන ප්‍රවේශ **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

**18.** (1) ලෝක සාමය සහ ආරක්ෂාව පිළිබඳව වගකීම් දරණ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන ආයතනය කුමක් ද?

..........................................................................................

(2) මානව අයිතිවාසිකම් සම්බන්ධව කටයුතු කරන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතනය නම් කරන්න.

..........................................................................................

**19.** ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල සිවිල් සමාජය සතු කාර්යයන් **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................

(2) ..........................................................................................

**20.** (1) ශ්‍රී ලංකාවේ බිහි වූ ප්‍රථම වාමාංශික දේශපාලන පක්ෂය නම් කරන්න.

..........................................................................................

(2) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් ලංකාවට හඳුන්වා දෙන ලද විදේශ ප්‍රතිපත්ති මතවාදය නම් කරන්න.

..........................................................................................

**



Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம் II
Political Science II

23 S II

**උපදෙස්:**

※ **B** හා **C** කොටස්වලින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

## B කොටස

**1.** දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 20)

**2.** රාජ්‍යය පිළිබඳ ලිබරල්වාදී න්‍යාය **හෝ** මාක්ස්වාදී න්‍යාය **හෝ** සාකච්ඡා කරන්න. (ලකුණු 20)

**3.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක්** විභාග කරන්න.
- (i) රාජ්‍යය සහ අන්‍ය සමාගම්
- (ii) රාජ්‍යය සහ ආණ්ඩුව
- (iii) රාජ්‍යය සහ ජාතිය
- (iv) ආණ්ඩුබලය සංවරණය කිරීමේ මාධ්‍ය (ලකුණු 10 × 2 = 20)

**4.** පහත දැක්වෙන ඕනෑම මාතෘකා **දෙකක්** පිළිබඳව සාකච්ඡා කරන්න.
- (i) කැබිනට් ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ
- (ii) ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ
- (iii) මිශ්‍ර ආණ්ඩුක්‍රමයක විධායකය
- (iv) ඒකීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ (ලකුණු 10 × 2 = 20)

## C කොටස

**5.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක්** සාකච්ඡා කරන්න.
- (i) ලංකා ජාතික සංගමය හා ජාතික ව්‍යාපාරය
- (ii) ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ ආරම්භය හා වර්ධනය
- (iii) යටත්විජිත සමයේ ලංකාවේ ආගමික පුනර්ජීවන ව්‍යාපාර
- (iv) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යුගයේ සුළුතර ප්‍රජාවන්ගේ දේශපාලනය (ලකුණු 10 × 2 = 20)

**6.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳව පවතින විවේචන කවරේදැයි පෙන්වා දෙන්න. (ලකුණු 20)

**7.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක්** විභාග කරන්න.
- (i) 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවේ බලතල සහ කාර්යභාරය
- (ii) 1978 ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ බලතල සහ කාර්යභාරය
- (iii) 1972 ව්‍යවස්ථාව යටතේ අධිකරණය
- (iv) 1978 ව්‍යවස්ථාව යටතේ අධිකරණය (ලකුණු 10 × 2 = 20)

**8.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.
- (i) සාක් සංවිධානය සහ කලාපීය සහයෝගීතාව
- (ii) එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ලෝක සාමය
- (iii) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය හැඩගස්වන සාධක
- (iv) ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ලෝක දේශපාලනය තුළ ඉටු කරන භූමිකාව (ලකුණු 10 × 2 = 20)

* * *

Department of Examinations Sri Lanka